සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමුවාර අවසාන ඇගයීම
First term End Evaluation - 2019

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) ගම්පොළ රාජ්‍ය සමයේ සිට කෝට්ටේ රාජ්‍ය සමය දක්වා මෙරට දේශපාලන තොරතුරු හැදෑරීමට වඩාත් ම වැදගත් කෘතිය වන්නේ,

(1) ථූපවංසය (2) මහාවංසටීකාව

(3) නිකාය සංග්‍රහය (4) රාජාවලිය

(02) තමන් විසින් නුදුටු එහෙත් වෙන අය විසින් පවසන ලද තොරතුරු අනුව කෘතීන් රචනා කළ කතුවරයෙක් වන්නේ,

(1) ප්ලීනි ය. (2) ඉබන් බතුතා ය.

(3) රිබෙයිරෝ ය. (4) රොබට් නොක්ස් ය.

(03) ක්‍රිස්තු වර්ෂ නවවන සියවසේ දී රචනා කරන ලද සෙල්ලිපියක වටාපතක සංකේතය මගින් නිරූපණය කර ඇත්තේ කුමක් ද?

(1) පවිත්‍රත්වය (2) සෞභාග්‍යය

(3) රාජකීයත්වය. (4) ස්ථාවරත්වය

(04) පනාකඩුව තඹ සන්නසෙන් පහත සඳහන් කුමන රජතුමාගේ තොරතුරු හෙළිවේ ද?

(1) පළමුවන ගජබාහු රජතුමා (2) පළමුවන විජයබාහු රජතුමා

(3) පළමුවන පරාක්‍රමබාහු රජතුමා (4) නිශ්ශංකමල්ල රජතුමා

(05) පුරාවස්තු අප විසින් ආරක්ෂා කරගත යුතු වන්නේ පහත සඳහන් කවර හේතුව නිසා ද?

(1) අපේ පැරණි මුතුන් මිත්තන්ගේ නිර්මාණ නිසා ය.

(2) අපේ අතීත පරම්පරාව ඒවා ආරක්ෂා කළ නිසා ය.

(3) ශ්‍රී ලාංකික අනන්‍යතාවය පෙන්නුම් කිරීමට ඉවහල් වන නිසා ය.

(4) ඒවාට හානි කිරීම රටේ නීතිය අනුව දඬුවම් ලැබිය හැකි වරදක් නිසා ය.

(06) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා ජීවත් වූ පහතරට තෙත් කලාපීය ලෙන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) මිනිහාගල්කන්ද , අළුගල්ගේ (2) බටදොඹලෙන, කිතුල්ගල බෙලිලෙන

(3) පොතාන, අලිගල (4) පාහියංගල, බෙල්ලන්බැඳිපැලැස්ස

(07) ◆ මළ සිරුරු දිරා යන තුරු වළලා පසුව ගොඩගෙන හිස්කබල සුමට කිරීම.

◆ දෙකට බෙදෙන ලෙස සිදුරු විදීම.

ඉහත සඳහන් අභිචාර විධි පැවති බවට තොරතුරු හමුවූයේ කුමන ස්ථානයකින් ද?

(1) පාහියංගල ලෙන (2) රාවණාඇල්ල ලෙන

(3) කුරුවිට බටදොඹලෙන (4) අළුලෙන

(08) මෙරට ඓතිහාසික යුගයේ මූලික ජනාවාස ගංගා නිම්නයට පිටතින් පිහිටි ප්‍රදේශවල ව්‍යාප්ත වී තිබීමට බලපෑ හේතුවක් විය හැක්කේ,

(1) ගම් වැව්වල ප්‍රමාණවත් ජලය තිබීමයි.

(2) හේන් වගාව බහුලව සිදු කිරීමයි.

(3) ජලය සංරක්ෂණය කර ප්‍රයෝජනයට ගැනීමයි.

(4) විනාශකාරී ගංවතුර පාලනය කිරීමට නොහැකි වීමයි.

(09) ශ්‍රී ලාංකික තානාපතිවරු චීනය සමග රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පැවැත් වූ බවට වැදගත් තොරතුරු හමුවූයේ කුමන රජතුමාගේ කාලයේ දී ද?

(1) දුටුගැමුණු රජතුමා (2) භාතිකාභය රජතුමා

(3) හයවන අග්ගබෝධි රජතුමා (4) පස්වන මහින්ද රජතුමා

(10) තිරුකේතීශ්වරම් හින්දු කෝවිල පිහිටා ඇත්තේ,

(1) යාපනය නගරයට සමීපව ය. (2) ගෝකණ්ණතිත්ථ වරායට සමීපව ය.

(3) හලාවත නගරයට සමීපව ය. (4) මාතොට වරායට සමීපව ය.

(11) පහත 'අ' තීරුවේ පූර්ව ඓතිහාසික යුගයේ පැවති ජනාවාස කිහිපයක් දැක්වෙන අතර 'ආ' තීරුවේ ඒවායේ ප්‍රධාන ආර්ථික කටයුත්ත දැක්වේ.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| (1) කේවට්ටගම | A ගොවිතැන |
| (2) කසීකාරගම | B වළං තැනීම |
| (3) නියම්ගම | C ධීවර කර්මාන්තය |
| | D වෙළඳාම |

'අ' තීරුව අනුව 'ආ' තීරුව ගැලපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

(1) A, C හා D (2) C, A හා D (3) D, B හා A (4) B, A හා C

(12) මහසෙන් රජතුමා විසින් කරවන ලදැයි සැලකෙන වැව් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) කන්තලේ වැව, ගිරිතලේ වැව (2) කවුඩුල්ල වැව, හුරුළු වැව

(3) පදවිය වැව, පත්පහන් වැව (4) යෝධ වැව, කලා වැව

(13) ස්වාභාවික සුළං බලය උපයෝගී කරගෙන අපේ මුතුන් මිත්තන් යකඩ නිස්සාරණය කළ බවට සාක්ෂි හමු වූ ප්‍රදේශය,

(1) බෙරගල (2) හල්දුම්මුල්ල
(3) දෙහිගහ ඇළකන්ද (4) සමනළ වැව

(14) ජල තරංගවලින් ඇතිවන බලය නිසා වැව් බැම්ම ඛාදනය වීම වළක්වා ලීමට පැරණි වාරි ශිල්පීන් යොදා ගනු ලැබූ තාක්ෂණික අංගය හැඳින්වූයේ කුමන නමින් ද?

(1) රළපනාව (2) සොරොව්ව
(3) බිසෝකොටුව (4) පිටවාන

(15) පහත 'අ' තීරුවේ දැක්වෙන පැරණි මිනුම් ක්‍රම 'ආ' තීරුවේ දැක්වෙන මිනුම් ඒකක හා කිසියම් සම්බන්ධතාවක් ඇත. 'අ' සහ 'ආ' තීරු නිවැරදිව ගලපා පිළිතුර තෝරන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| (1) ආංගුලය | A අවකාශය මැනීම |
| (2) ගව්ව | B කෙටිදුර මැනීම |
| (3) කරීසය | C බර මැනීම |
| (4) කලඳ | D දිගුදුර මැනීම |

(1) A, D, B, C (2) D, B, A, C (3) B, D, C, A (4) B, D, A, C

(16) සමාජ ධූරාවලිය අනුව සෙල්ලිපිවල 'කුඩීන්' නමින් හඳුන්වා ඇත්තේ කවුරුන් ද?

(1) ගොවියෝ ය. (2) කම්මල්කරුවෝ ය.
(3) සාමාන්‍ය ජනතාව ය. (4) ධනවත් වෙළඳ ප්‍රධානීන් ය.

(17) දෙමාපියන් විසින් තමන්ගේ දියණියන් සූප ශාස්ත්‍රයෙහි නිපුණ කරවනු ලැබීම ඔවුන් සතු වගකීමක් බව සඳහන් වන්නේ මින් කුමන මූලාශ්‍රයෙහි ද?

(1) සහස්සවත්ථුප්පකරණය (2) සද්ධර්මාලංකාරය
(3) ධම්පියා අටුවා ගැටපදය (4) රසවාහිනී

(18) පහත A, B, C, D යටතේ දැක්වෙන ඓතිහාසික සිදුවීම් අතුරෙන් කාලිංග මාඝ ආක්‍රමණය පැවති අවධියේ ජීවත්වූවෙකුට අසන්නට හෝ දැන ගැනීමට **නොලැබෙන** සිදුවීම ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) අභයගිරිය දාගැබ ගොඩ නැංවීම
(2) සුලෙයිමාන් නැමැති දේශගවේෂකයෙකු ශ්‍රී පාදය වන්දනා කිරීම
(3) සිංහල සංගෙ නමින් හැඳින් වූ කැරැල්ල ඇතිවීම
(4) යාපනය ප්‍රදේශය පාලනය කිරීමට සෘෂිගිරි නම් ඇමතිවරයා පත්කිරීම

(19) ගම්පොළ රාජධානි සමයේ දී මාතෘ මූලික උරුම ක්‍රමයට අනුව මාමාගෙන් පසු බෑනාට රජකම හිමිවූයේ කා හට ද?

(1) සිව්වන විජයබාහු රජතුමාට ය. (2) තුන්වන වික්‍රමබාහු රජතුමාට ය.
(3) හයවන පරාක්‍රමබාහු රජතුමාට ය. (4) හත්වන පරාක්‍රමබාහු රජතුමාට ය.

(20) අටවන වීර පරාක්‍රමබාහු නමින් රාජ්‍යත්වයට පත්වූයේ,

(1) ටිකිරි බණ්ඩාර කුමරු ය. (2) මහා අස්ථාන කුමරු ය.

(3) සපුමල් කුමරු ය. (4) අම්බුලුගල කුමරු ය.

(21) යාපන රාජධානිය බිඳ වැටීමට බලපෑ ප්‍රබල හේතුවක් **නොවන්නේ** මින් කුමක් ද?

(1) රාජ්‍ය උරුමකරුවන් අතර බල අරගල පැවතීම

(2) ප්‍රමාණවත් නිත්‍ය හමුදාවක් පාලකයින්ට නොසිටීම

(3) පෘතුගීසිහු තමන්ට ගැති පාලකයෙකු සිංහාසනයට පත්කිරීම

(4) උඩරටට මෙන් ස්වාභාවික ආරක්ෂාවක් නොතිබීම

(22) සියම් දේශයට දූතයන් යවා උපාලි හිමියන් ප්‍රමුඛ භික්ෂූන් මෙරටට වැඩමවා යළි උපසම්පදාව මෙරට පිහිටුවීමට කටයුතු කළ රජතුමා

(1) පළමුවන විමලධර්මසූරිය රජතුමා

(2) දෙවන විමලධර්මසූරිය රජතුමා

(3) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා

(4) රාජාධිරාජසිංහ රජතුමා

**(23) - (24) ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත ප්‍රකාශ උදවු කර ගන්න.**

A සටන් මඟින් උඩරට අල්ලා ගැනිමට ක්‍රියා කිරීම

B ධර්මපාල කුමරු කෝට්ටේ රජ කරවීමට කටයුතු කිරීම

C කුරුඳු වගා කිරීම හා ආරක්ෂා කිරීම

D මුහුදුබඩ ප්‍රදේශවල රෙපරමාදු ආගම ව්‍යාප්ත කිරීම

E නව බදු වර්ග පනවා උපරිම ලාභ සෙවීම

(23) ඉහත ප්‍රකාශ අතුරින් පෘතුගීසි පාලනය හා සම්බන්ධ ප්‍රකාශ ඇතුළත් පිළිතුර පිළිතුර කුමක් ද?

(1) B හා D (2) C හා E (3) A හා D (4) A හා B

(24) ඉහත ප්‍රකාශ අතුරින් ලන්දේසි පාලනය හා සම්බන්ධ ප්‍රකාශ ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) C හා D (2) A හා E (3) A හා C (4) B හා E

(25) කුසුමාසන දේවිය උඩරට රැජින වශයෙන් පත්කිරීම සඳහා පේරෝලෝපෙස් ද සූසා යටතේ දියත් කළ ඓතිහාසික සටන හැඳින්වූයේ කුමන නමින් ද?

(1) බලන සටන (2) ගන්නෝරුව සටන

(3) දන්තුරේ සටන (4) රන්දෙනිවල සටන

(26) පෘතුගීසින්ට එරෙහි ප්‍රහාර සඳහා ඉන්දියාවේ කැලිකට් පාලකයා වූ සැමොරින්ගේ සහාය ලබාගත් රජතුමා

(1) මායාදුන්නේ රජතුමා (2) පළමුවන විමලධර්මසූරිය රජතුමා

(3) පළමුවන රාජසිංහ රජතුමා (4) දෙවන රාජසිංහ රජතුමා

(27) රාජාධිරාජසිංහ රජතුමා හමුවීමට උඩරටට ගිය ඉංග්‍රීසි දූතයා

(1) ජෝන් පයිබස් ය. (2) හියුබොයිඩ් ය.

(3) රොබට් ඇන්ඩෲස් ය. (4) ස්පිල්බර්ජන් ය.

(28) ඉංග්‍රීසි ජාතිකයින් ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමල වරාය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට බලපෑ සාධක ඇතුළත් පිළිතුර තෝරන්න.

A ත්‍රිකුණාමල වරාය පර්සියන් බොක්කට මුහුණ ලා පිහිටීම

B සුළඟින් නැව් ආරක්ෂා කරගත හැකිවීම

C ඉන්දියාවේ බටහිර වෙරළේ ඉංග්‍රීසි නාවික බලය ආරක්ෂා කර ගැනීම

D නැව් විශාල සංඛ්‍යාවක් නවතා තැබිය හැකි වීම

(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

(29) පහත සඳහන් තොරතුරු ඓතිහාසික අනුපිළිවෙළට පෙළ ගැස් වූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

A පෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරයා උඩරට ආක්‍රමණය

B මෙරට මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත්වීම

C විලියම් හෝකින්ස් යටතේ නැව් කණ්ඩායමක් ඉන්දියාවට පැමිණීම

D තෝමස් මෙට්ලන්ඩ් මෙරට ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා ලෙස පත්වීම

(1) ACDB (2) BCAD (3) DCBA (4) CBAD

(30) උඩරට ගිවිසුමේ හතරවන වගන්තියෙන් ප්‍රකාශ කර ඇත්තේ,

(1) උඩරට සාම්ප්‍රදායික නිලධාරී පන්තියේ වරප්‍රසාද හා අයිතිවාසිකම් සුරකින බව ය.

(2) බුද්ධ ශාසනය හා දේවාගම කඩ නොකොට පවත්වාගෙන යන බව ය.

(3) රජුට හා ඥාතීන්ට උඩරට සිහසුනට ඇති අයිතිවාසිකම් අහිමි බව ය.

(4) උඩරට රාජධානියේ අධිකරණ කටයුතු පවත්වාගෙන යන අයුරු ය.

(31) පහත සඳහන් නායකයන් අතුරින් 1818 නිදහස් සටනට පුරෝගාමී වූ නායකයින් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ගොන්ගාලේගොඩබණ්ඩා, පුරන් අප්පු

(2) ඩිංගිරාළ, දිනෙස්

(3) ගලගෙදර මොහොට්ටාල, බූටැවේරටේරාළ

(4) කැප්පෙටිපොළ, ඩිංගිරාළ

(32) සියම් රටේ රජතුමාගෙන් ද ආධාර ලබාගෙන ධම්මාලංකාර සිරිසුමනතිස්ස හිමියන් විසින් පිහිටුවන ලද මුද්‍රණාලය

(1) ලංකෝපකාර මුද්‍රණාලය (2) සරසවි සඳරැස මුද්‍රණාලය

(3) සුදර්ශන මුද්‍රණාලය (4) ලංකාභිනව විශ්‍රැත මුද්‍රණාලය

(33) නාට්‍ය මගින් මද්‍යසාර භාවිතයේ අයහපත පෙන්වීම සඳහා සිංහල පරාභව නාට්‍යයේ සුරා කාණ්ඩය රචනා කරන ලද්දේ,

(1) ජෝන් ද සිල්වා මහතා ය. (2) පියදාස සිරිසේන මහතා ය.

(3) වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා ය. (4) අනගාරික ධර්මපාලතුමා ය.

(34) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන්ගේ පුරෝගාමීත්වයෙන් පිහිටුවන ලද පිරිවෙන මින් කුමක් ද?

(1) පරමධම්මචේතිය පිරිවෙන (2) දික්සඳසෙනෙවියා පිරිවෙන

(3) විද්‍යාලංකාර පිරිවෙන (4) විද්‍යෝදය පිරිවෙන

(35) යුරෝපා පුනරුද සමයේ කොන්ස්තන්තිනෝපල් නගරය සම්බන්ධ වැදගත් තොරතුර මින් කුමක් ද?

(1) බොහෝ කලාකරුවන් ජීවත් වූ නගරයයි.

(2) ග්‍රීක, රෝම පොත්පත් සුරක්ෂිතව පැවති නගරයයි.

(3) මෙඩිසි නම් ධනවත් පවුල ජීවත් වූ නගරයයි.

(4) බැසිලිකා හා සිස්ටයින් දෙව්මැදුරු පිහිටි නගරයයි.

(36) යුරෝපීයයන් ප්‍රථමයෙන් ආසියාවට පැමිණීමට සොයාගත් නව මුහුදු මාර්ග ඔස්සේ ඉන්දියාවට පැමිණියේ,

(1) ක්‍රිස්ටොපර් කොළොම්බස් ය. (2) වස්කෝ ද ගාමා ය.

(3) බර්තෝලමියුඩස් ය. (4) ප්‍රැන්සිස්කු ද අල්මේදා ය.

- **කාර්මික විප්ලව සමයේ නිපදවන ලද පහත සඳහන් උපකරණ ඇසුරින් 37 - 38 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A දුවන නඩාව B රෝලර් යන්ත්‍රය

C ආරක්ෂක ලාම්පුව D මියුල් යන්ත්‍රය

(37) පේෂ කර්මාන්තයේ දියුණුව සඳහා උපයෝගී වූ නිමැවුම් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A හා C (2) A හා D (3) B හා D (4) B හා C

(38) යකඩ හා වානේ කර්මාන්තය සහ ගල් අඟුරු කර්මාන්තයේ දියුණුවට උපයෝගී වූ නිමැවුම් දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) B හා D (2) C හා D (3) A හා C (4) B හා C

(39) මෙරට ප්‍රථම දුම්රිය මාර්ගය ඉදිකිරීමේ ගෞරවය හිමිවන්නේ මින් කුමන ආණ්ඩුකාරවරයාට ද?

(1) හෙන්රිවෝඩ් (2) එඩ්වඩ් බාන්ස්

(3) පෙඩ්රික් නෝර්ත් (4) රොබට් බ්‍රවුන්රිග්

(40) විසිවන සියවසේ මුල් දශක කීපය තුළ කාර්මික ක්ෂේත්‍රයේ අති විශාල ප්‍රගතියක් උදාකර ගත් ආසියාතික රට

(1) ජපානය (2) චීනය (3) ඉන්දියාව (4) දකුණු කොරියාව

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

පළමුවාර අවසාන ඇගයීම
**First term End Evaluation** - 2019

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 03 |

සැලකිය යුතුයි:
- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) මන්නාරම, එලිෆන්ට්පාස්, කෝනේශ්වරම්, පිදුරංගල, පල්ලවවංක, උරුවේල, බදුල්ල, කොළඹ, කුඹුක්කන්ඔය, කලාවැව, මාගම, කන්තලේ වැව (ලකුණු 12)

(ii) රතුමුහුද, කල්කටා, පොන්ඩිචේරි, ප්‍රංශය, වැනීසිය, බතාවිය (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාල පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - මීට වසර එක්ලක්ෂ විසිපන්දහසකට පෙර මෙරට ජනාවාස කළ ආදි මානවයා
B - සීගිරිය රාජධානිය කරගත් රජතුමා
C - පළමුවන විමලධර්මසූරිය රජු දවස උඩරටට පැමිණි පළමු ලන්දේසි ජාතිකයා
D - උඩරට ගිවිසුමට අත්සන් තැබූ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා (ලකුණු 04)

- A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

(ii) (1) A අක්ෂරයෙන් දැක්වෙන පින්තූරය හඳුනාගෙන නම් කරන්න.
(2) ශ්‍රී ලංකාවේ කවර ඓතිහාසික නගරයක මෙය දක්නට ලැබේ ද?
(3) මෙය කර වූ රජතුමාගේ නම කුමක් ද?
(4) මෙවැනි නිර්මාණ සඳහා බහුලව යොදාගෙන ඇති අමුද්‍රව්‍ය කුමක් ද? (ලකුණු 04)



A රූපය

(iii) (1) B පින්තූරයේ දැක්වෙන උපකරණය කුමක් ද?
(2) එය නිපදවූයේ කවුරුන් විසින් ද?
(3) කාර්මික විප්ලව සමයේ කුමන ක්ෂේත්‍රයක දියුණුවක් මෙයින් පිළිබිඹුවේ ද?
(4) මෙම ක්ෂේත්‍රයේ දියුණුව සඳහා නිපද වූ වෙනත් උපකරණයක් නම් කරන්න. (ලකුණු 04)



B රූපය

## II කොටස

(02) (i) ගල් යුගයට අයත් ප්‍රජාව ජීවත් වූ පරිසර කලාප තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

(ii) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන්කර හඳුනාගැනීමට ඉවහල් වන සාධක දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයින්ගේ අභිචාර විධි පැවති ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ස්වරූපය කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(03) (i) පොළොන්නරුව රාජධානිය පරිහානියට පත්වීමෙන් පසුව පහත සඳහන් පාලකයින් තම පාලන මධ්‍යස්ථාන පිහිටුවාගත් ප්‍රදේශ අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - සුභ සෙනෙවි

B - බුවනෙකබාහු ආදිපාදවරයා

C - සංඛ සෙනෙවි (ලකුණු 03)

(ii) A. කුරුණෑගල

B. කොට්ටේ රාජ්‍ය සමයේ ලියැවුණු සාහිත්‍ය ග්‍රන්ථ දෙක බැගින් පහත ලැයිස්තුවෙන් තෝරා අනුපිළිවෙළින් ලියන්න.

(දළදා සිරිත , කව්සිළුමිණ, පන්සිය පනස්ජාතක පොත, සිදත් සඟරාව, බුදුගුණාලංකාරය, සද්ධර්මාලංකාරය, ලෝවැඩ සඟරාව) (ලකුණු 04)

(iii) දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ දේශපාලන සේවාව උදාහරණ දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු තෙත් කලාපීය ප්‍රදේශවලට සංක්‍රමණය වූ ජනතාවගේ ආර්ථික රටාව වෙනස් වූ ආකාරය කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(04) (i) මහනුවර රාජධානිය හැඳින් වූ වෙනත් නම් තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් කාර්යයන් උදෙසා අයකළ බදු වර්ග හැඳින්වූයේ කුමන නම් වලින්දැයි A, B, C, D අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - රෙදි විවීම සඳහා

B - ප්‍රවාහන කටයුතු සඳහා

C - වළං තැනීම සඳහා

D - අලි ඇතුන් ඇල්ලීම සඳහා (ලකුණු 04)

(iii) උඩරට රාජධානියේ ආර්ථිකය සකස් වී තිබූ ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දෙවන රාජසිංහ රජතුමා සිය පාලන සමයේ දී මුහුණ දුන් අභියෝග තුනක් නම්කර, ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 06)

(05) (i) පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණෙන අවධියේ මෙරට පැවති රාජධානි තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) සීතාවක රාජධානියේ පරිහානියට හේතු වූ කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) උඩරට රාජධානියේ බලය ලබා ගැනීමට පෘතුගීසීන් එල්ල කළ සියලු ආක්‍රමණ අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ලන්දේසිහු ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවලින් උපරිම ආර්ථික වාසි ලබා ගැනීමේ අරමුණින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

(06) (i) පහත A, B, C වලින් දැක්වෙන තොරතුරුවලට සම්බන්ධ එක් එක් පුද්ගලයා කවුරුන්දැයි අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - ක්‍රි. ව. 1803 දී උඩරට ආක්‍රමණය සඳහා නායකත්වය ගත් ඉංග්‍රීසි සෙන්පතියා

B - කන්නසාමි කුමරුට උඩරට රජවීමට උපකාර කළ මහාධිකාරම

C - උඩරට අල්ලා ගැනීම සඳහා උපායශීලී ප්‍රතිපත්ති සැලසුම් කළ ඉංග්‍රීසි සිවිල් නිලධාරියා

(ලකුණු 03)

(ii) ශ්‍රී ලංකාව කෙරෙහි බ්‍රිතාන්‍යයින්ගේ අවධානය යොමුවීමට බලපෑ ප්‍රධාන හේතු දෙක සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ක්‍රි. ව. 1797 වර්ෂයේ දී ඉංග්‍රීසි වෙළඳ සමාගමට එරෙහිව ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවල කැරැල්ලක් ඇතිවීමට බලපෑ සාධක දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ඉංග්‍රීසින් උඩරට රාජධානිය අවනත කර ගැනීමට හෝ යටත් කර ගැනීමට අවධානය යොමු කළේ ඇයිදැයි කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(07) (i) කිතු දහම පැතිරවීම සඳහා මෙරටට පැමිණි මිෂනාරි සංවිධාන තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - පානදුරාවාදයේ දී බෞද්ධ පක්ෂය වෙනුවෙන් වාද කළ ස්වාමීන් වහන්සේ

B - මුස්ලිම් නෙයිසන් නම් පුවත්පත ආරම්භ කිරීමට පුරෝගාමී වූ මුස්ලිම් නායකයා

C - අනුරාධපුරයේ පූජනීය ස්ථාන ආරක්ෂා කර ගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කළ පුද්ගලයා

D - ඕල්කට්තුමාගේ මඟපෙන්වීම යටතේ මෙරට පිහිටුවන ලද සමාගම (ලකුණු 04)

(iii) මෙරට අමද්‍යප ව්‍යාපාරයේ නායකත්වය ගත් පුද්ගලයින් දෙදෙනෙකු නම් කර, ඒ සඳහා ඔවුන් අනුගමනය කළ ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ලකුණු 05)

(iv) හින්දු ආගමික පුනර්ජීවනය උදෙසා දමිළ නායකයින් කැප වී ක්‍රියා කළ ආකාරය උදාහරණ තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

## III කොටස

(08) (i) බ්‍රිතාන්‍ය හැරුණු විට කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ යුරෝපා රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයේ ආරම්භ වීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) කාර්මික විප්ලවය නිසා කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) කාර්මික විප්ලවය නිසා ඇති වූ ප්‍රබලම අයහපත් ප්‍රතිඵලය පරිසර දූෂණයයි'' උදාහරණ තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(09) (i) මයිකල් ආන්ජිලෝ විසින් නිර්මාණය කළ අග්‍රගණ්‍ය ප්‍රතිමා තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත දැක්වෙන මත සහ නිර්මාණ ලොවට දායාද කළ පුද්ගලයින්ගේ නම් A, B, C හා D අනුපිළිවෙළින් ලියන්න.

A - ගුරුත්වාකර්ෂණ නියමය

B - දුරදක්නය


C - ග්‍රහලෝක සූර්යයා වටා ඉලිප්සාකාරව ගමන් කරන බව

D - රුධිර සංසරණ පද්ධතිය පිළිබඳ තොරතුරු සොයා ගැනීම (ලකුණු 04)

(iii) පුනරුද සමයේ දේශපාලන හා ආර්ථික නවෝදය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) යුරෝපා පුනරුදයේ බලපෑම මත ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයේ හා ආර්ථික ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(01) (අ) (i) ප්‍රශ්නය සඳහා



(01) (අ) (ii) ප්‍රශ්නය සඳහා

